සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය | **ක්‍රිස්තියානි ධර්මය - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකය:

- 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1,2,3,4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරා ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ අංකයට ගැලපෙන කවය තුළ **(x)** ලකුණ යොදන්න.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

01. ''එම්මානුවෙල්'' යන්නෙහි අර්ථය වන්නේ,
(1) ''දෙවියන් වහන්සේ අප මුදන සේක'' යන්න ය.
(2) ''දෙවියන් වහන්දේ අප සමඟය'' යන්න ය.
(3) ''දෙවියන් වහන්සේ ආලේප කරන ලද'' යන්න ය.
(4) ''දෙවියන් වහන්සේ තෝරාගත් සේක'' යන්න ය.

02. කිතු උපත පිළිබඳ දිවැස්වැකි ප්‍රකාශ කළ දිවසිවරු දෙදෙනා වන්නේ,
(1) දිවසිවර නාතාන් හා යෙසායා ය.
(2) දිවසිවර මීකා හා නාතන් ය.
(3) දිවසිවර මීකා හා යෙසායා ය.
(4) දිවසිවර යෙසායා හා ජෙරමියා ය.

- පහත ප්‍රකාශ ඇසුරෙන් 3 - 4 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

''වනාන්තරයේ සම්දුන් හට මාවතක් එළි කරන්න. පාළුකරයේ අපේ දෙවිදුන් හට මහ පාරක් සාදන්න.''

03. ඉහත බයිබල් පාඨයෙන් කියවෙන්නේ,
(1) ජේසුස් වහන්සේගේ සේවය පිළිබඳව ය.
(2) පේදුරු තුමාගේ සේවය පිළිබඳව ය.
(3) එළියා දිවැසිවරයාගේ සේවය පිළිබඳව ය.
(4) ස්නාවක ජොහාන්තුමාගේ සේවය පිළිබඳව ය.

04. ඉහත ප්‍රකාශය සිදුකරන ලද දිවැසිවරයා කවු ද?
(1) දිවසිවර මීකා ය. (2) දිවසිවර යෙසාය ය.
(3) දිවසිවර මලාකි ය. (4) දිවසිවර නාතාන් ය.

05. යහපත් දේව සබඳතාවයක් පවත්වා ගැනීම සඳහා අප තුළ තිබිය යුතු ගුණාංගයක් නොවන්නේ,
(1) වංකකම (2) ඇදහිල්ල (3) ධර්මිෂ්ඨකම (4) යුක්තිගරුක බව

06. ජේසුස් වහන්සේ තම සේවය ආරම්භක පියවර තබන ලද්දේ,
(1) ජෙරුසලම් දේව මාළිගාව තුළ දී ය. (2) කානා හි සරණ මංගල්‍යයේ දී ය.
(3) ගලීල මුහුදු තීරයේ දී ය. (4) නාසරෙත් ධර්ම ශාලාවේ දී ය.

07. ''මෙන්න ලෝකයේ පව් දුරුකරන බැටළු පෝතකයාණෙනි'' යනුවෙන් ජේසුස් වහන්සේව හඳුන්වන ලද්දේ කවු ද?
(1) ස්නාවක ජොහාන් තුමා ය. (2) පේදුරු තුමා ය.
(3) ශතාධිපතියා ය. (4) දෙවියන් වහන්සේ ය.

08. කාලය හෝ වයස දේව සැලැස්ම ඉටු කිරීමට බාධාවක් නොවන බව පෙන්වීමට වඩාත් උචිත සිදුවීම මින් කුමක් ද?
(1) ජේසුස් වහන්සේ මෙලොවට මංශ ගතවීම ය.
(2) එළිසබෙත් තුමිය දරුවෙකු පිළිසිඳ ගැනීම ය.
(3) සෙකරියස් පූජකතුමාට දුම් පූජා ඔප්පු කිරීමට අවස්ථාව ලැබීම ය.
(4) දිවසිවර හොසියාගේ ජීවිත කතාව ය.

Past Papers Wiki

09. ජේසුස් වහන්සේ අයත් වූයේ,
(1) අබියාගේ ජේරුවට හා වංශයට ය.
(2) දාවිත්ගේ පෙළපතට හා අබියාගේ වංශයට ය.
(3) දාවිත්ගේ පෙළපතට හා වංශයට ය.
(4) අබියාගේ වංශයට හා දාවිත්ගේ පෙළපතට ය.

10. දාවිත්ගේ නුවර උපන් ''ක්‍රිස්තුස්'' නම් ගැළවුම්කරුගේ සළකුණ ලෙස දේවදූතයන් එඬේරුන්ට සැලකළේ,
(1) පෙරදිග අහසේ බැබළෙන තාරකාව ය.
(2) ගව ඔරුවක බාවා සිටින බිළිදෙක් ය.
(3) ලෝකයේ පව් දුරු කරන බැටළු පෝතකයාණෝ ය.
(4) ශාස්ත්‍රවන්තයින් තිදෙනා රැගෙන ආ පඬුරු ය.

11. ''දෙවියන් වහන්සේට සන්තක වීම.'' අදහස් වන ජුදා චාරිත්‍රය මින් කුමක් ද?
(1) බෞතිස්ම ස්නාපනය
(2) කුළුඳුලන් කැප කිරීම
(3) චර්මඡේදනය
(4) නම් තැබීම

12. ''ජේසුස් වහන්සේ ..... හා ..... දෙවියන් වහන්සේගෙන් හා මිනිස්සුන්ගෙන් ද ප්‍රසාදය ලබමින් වැඩුණු සේක. ඉහත ප්‍රකාශයෙහි හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
(1) ප්‍රඥා මහිමයෙන් හා ආත්ම විශ්වාසයෙන්
(2) ප්‍රඥා මහිමයෙන් හා ප්‍රේමයෙන්
(3) කාය ශක්තියෙන් හා ප්‍රඥා මහිමයෙන්
(4) ප්‍රඥා මහිමයෙන් හා කාය ශක්තියෙන්

13. ජෙරුසලමෙන් ඈත්ව සිටි ජුදෙව්වන් තම ආගමික කටයුතු සහා රැස්වූයේ මින් කුමන ස්ථානයකට ද?
(1) සිනගෝගයට ය. (2) දේව මාළිගාවට ය. (3) රජ මාළිගාවට ය. (4) පුණ්‍ය අයාතනවලට ය.

14. සෑම ජුදෙව්වෙක් ම වසරකට තුන් වරක්වත් මංගල්‍යය සැමරුම්වලට සහභාගී වීමට පැමිණීම පිළිබඳ නියමය සඳහන් වන්නේ,
(1) උත්පත්ති පොතෙහි ය.
(2) ලෙවි ව්‍යවස්ථාවෙහි ය.
(3) නික්මයාම පොතෙහි ය.
(4) ගණන් කතාවෙහි ය.

15. තම වරද පෙන්වාදීම නිසා ස්නාවක ජොහාන් තුමාගේ ජීවිතයට පවා තර්ජනයක් වූ පාලකයා වන්නේ,
(1) හෙරොද් රජතුමා ය.
(2) පිලාත් ආණ්ඩුකාරවරයා ය.
(3) උත්තම පූජක කායාපසයි ය.
(4) රෝම ආණ්ඩුකාර සීසර් ය.

16. ''මාගේ මෑණියෝත්, සහෝදරයෝත් නම් දෙවියන් වහන්සේගේ වචනය අසා ඒවා පිළිපදින්නෝ වෙති.'' ජේසුස් වහන්සේ මෙසේ පැවසීමෙන් අනාවරණය කළේ,
(1) දේවවචනය ඇසීමේ වැදගත්කම පෙන්වීම ය.
(2) පවුලේ නිර්මාතෘවරයාණන් දෙවියන් වහන්සේ බව ය.
(3) ලේ නෑකම අභිබවා යන නව පවුල් සංකල්පය ස්ථාපිත කිරීම ය.
(4) දේව රාජ්‍යයේ ගුණාංග ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම ය.

17. ව්‍යවස්ථාව ඉක්මවා යන මනුෂ්‍යත්වයේ වැදගත් බව පරිසිවරුන්ට අවධාරණය කළේ,
(1) සබත් දින අතක් පණ නැති මිනිසා සුව කිරීමෙනි.
(2) යායිරස්ගේ දියණිය මරණින් උත්ථාන කිරීමෙනි.
(3) ශාතාධිපතියාගේ දාසයා සුව කිරීමෙනි.
(4) ලාදුරු රෝගීන් දසදෙනා සුවපත් කිරීමෙනි.

18. ''ස්වාමීණි මා ඔබගේ උපකරණයක් කරගත මැනව.'' මෙලෙස යාච්ඥා කළේ,
(1) තාර්සස්හි පාවුල් තුමාය.
(2) නාසරෙත් හි ජේසු තුමාය.
(3) ජෙරුසලමේ පේදුරු තුමාය.
(4) අසීසියේ ෆ්‍රැන්සිස් තුමාය.

19. වසර 12 ක් සුවය පිළිබඳ බලාපොරොත්තු සුන්ව සිටි අවස්ථාවක ජේසුස් වහන්සේගෙන් පූර්ණ සුවය ලැබුයේ,
(1) පව්කාර ස්ත්‍රීය ය.
(2) මහලේ රෝගී කාන්තාව ය.
(3) සමාරියේ ස්ත්‍රීය ය.
(4) කුඳු ස්ත්‍රිය ය.

20. ජුදෙව් ආගමික නීතිය අනුව චෝදනා විභාග කර තීන්දුව දෙනු ලැබුවේ,
(1) ජෙරුසලම් දෙවි මැදුරේ දී ය. (2) සිනගෝගයේ දී ය.
(3) මහාධිකරණයේ දී ය. (4) ශ්‍රේෂ්ඨාධිකරණයේ දී ය.

21. දේව මාළිගාව පවිත්‍ර කිරීමේ සිද්ධිය මඟින් වර්තමාන කිතුනුවන්ට ලැබෙන අභියෝග වන්නේ,
(1) සාම්ප්‍රදායික නමස්කාර ක්‍රමයෙන් බැහැර වීම ය.
(2) ආගමික ස්ථානවල අඩු පාඩු විමසා බැලීම ය.
(3) දෙව් මැඳුරුවල අරමුදල් මුල් කරගෙන වැඩසටහන් පැවැත්වීමය.
(4) දේවස්ථාන යාච්ඤා ගෘහයන් ලෙස පමණක් යොදා ගැනීම ය.

22. ජේසුස් වහන්සේගේ මෘත දේහය හණ රෙදිවලින් ඔතා කිසිවෙකු නොතැබූ සොහොනක තැම්පත් කිරීමට භාර ගත්තේ,
(1) සිරේනියේ සීමෝන් ය. (2) අරිමාතියේ ජෝසෙප් ය.
(3) ස්නාවක ජොහාන් ය. (4) ජුදස් ඉස්කාරියෝත් ය.

23. පහත දැක්වෙන්නේ ජේසුස් වහන්සේගේ දුක් විඳීම හා මරණය සම්බන්ධ කියමන් කිහිපයකි.
A - ''ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෙනි.''
B - ''ඔබ යළිත් හැරුණු පසු ඔබේ සහෝදරයින් ධෛර්යමත් කරන්න.''
C - ''ජේසුස් වහන්ස, ඔබ රාජශ්‍රීයෙන් වඩිනා කළ මා සිහි කළ මැනවි.''
D - ''ඔබ ජුදෙව්වන්ගේ රජ නම් ඔබ ඔබවම ගලවා ගන්න.''
මේ අතරින් කුරුසියපත් ව සිටි ජේසුස් වහන්සේ ට ඉදිරිපත් කළ ප්‍රකාශ වන්නේ,
(1) C සහ D ය. (2) A සහ B ය. (3) A සහ C ය. (4) B සහ C ය.

24. සද්දිසිවරු ජේසුතුමා පරීක්ෂා කිරීමට ඉදිරිපත් කළ ප්‍රශ්නයක් නොවන්නේ,
(1) පුනර්ජීවනය පිළිබඳ ප්‍රශ්නය යි.
(2) අධිරාජ්‍යයාට බදු ගෙවීම පිළිබඳ ප්‍රශ්නය යි.
(3) ජේසුස් වහන්සේගේ අධිකාරී බලය පිළිබ ප්‍රශ්නය යි.
(4) දාවිත්ගේ පුත්‍රයා පිළිබඳ ප්‍රශ්නය යි.

25. ශුද්ධ බයිබලයේ ''වලාපටලය'' මඟින් නිතර සංකේතවත් කෙරෙන්නේ,
(1) දේව බලය යි. (2) දේව ආශිර්වාදය යි.
(3) දේව අභිමුඛත්වය යි. (4) දේව සැලැස්ම යි.

26. ජේසුස් වහන්සේගේ දේශනවලට මූලික හරය වූයේ,
(1) දේව රාජ්‍යය යි. (2) ගැලවීම යි. (3) ප්‍රේමය යි. (4) ශුද්ධාත්මය යි.

27. දේව රාජ්‍යය කිසිවෙකුගේ මැදිහත්වීමකින් තොරව අභිරහස්මය ලෙස වර්ධනය වන බව පෙන්වීමට ජේසුස් වහන්සේ ඉගැන් වූ උපමා කථාව වන්නේ,
(1) අබ ඇටයේ උපමාව ය. (2) වපුරන්නාගේ උපමාව ය.
(3) මුහුන් පිළිබඳ උපමාව ය. (4) රන් කාසි දසය පිළිබඳ උපමාව ය.

28. ජොහාන් ශුභාරංචියේ දේව බල සලකුණු හැඳින්වීමට භාවිත කළ ග්‍රීක වදන වන්නේ,
(1) ඩුනොමිස් ය. (2) අගපේ ය. (3) අයිරේනියා ය. (4) සේමෙයොන් ය.

29. දේව රාජ්‍යයේ ලකුණු හෙවත් ප්‍රාතිහාර්ය බෙදෙන ප්‍රධාන කොටස් ගණන වන්නේ,
(1) 2 කි. (2) 4 කි. (3) 6 කි. (4) 8 කි.

30. ජේසුස් වහන්සේ මහා මංගල භෝජනය පිළිබඳ උපමාව පවසන ලද්දේ,
(1) පර්සිවරයෙකුගේ නිවසේ භෝජන සංග්‍රහයකට සහභාගී වූ අවස්ථාවේ ය.
(2) ශ්‍රාවකයින් සමඟ රාත්‍රී භෝජනය ගත් අවස්ථාවේ ය.
(3) සිනගෝගයේ උගන්වමින් සිටි අවස්ථාවේ ය.
(4) ගලීල මුහුදු වෙරළේ සිටින අවස්ථාවේ ය.

31. දේව සබඳතාව ගොඩනඟා ගැනීමට කිතුනු අප සතු ප්‍රබල අවියක් වන්නේ,
(1) දේව වචනය යි. (2) සාක්ෂි දැරීම යි.
(3) දේවස්ථානයට යාම යි. (4) යාච්ඤාවයි.

32. ''දැන් සාගිනි ඇති ඔබ භාග්‍යවන්තයෝය.'' මන් ද ඔබ ..... ඇත. ඉහත හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
(1) සිනාසෙනු (2) හඬා වැලපෙනු (3) තෘප්තිමත්වනු (4) සැනසෙනු

33. A - ප්‍රේමයේ ආධිපත්‍ය දරයි.
B - යටත් අය නායකයාට සේවය කරති.
C - නායකයා සේවය ලබයි.
D - යටත් අය සේවය ලබයි.
ඉහත වරණ වලින් දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ නායකත්වය ධූරාවලියට අයත් ලක්ෂණ පමණක් අඩංගු වන්නේ,
(1) A සහ B ය. (2) A සහ D ය. (3) A සහ C ය. (4) C සහ D ය.

34. ජේසුස් වහන්සේ ස්වභාව ධර්මය අභිබවා කළ ක්‍රියාවක් යටතට ගැනෙන ප්‍රාතීහාර්යකට උදාහරණයක් වන්නේ,
(1) අංශභාගී රෝගියා සුව කිරීම ය. (2) යක්ෂාවේශ වුවෙකුට සහනය දීම ය.
(3) කුණාටුව නිශ්චල කිරීම ය. (4) යායිරස්ගේ දියණි සුව කිරීම ය.

35. වපුරන්නාගේ උපමාවේ ''අවංක පවිත්‍ර සිතකින් වචනය අසා පිළිපැඳ ඵලදරන අය'' සමාන කරන්නේ,
(1) මඟ අසළ වැටුණු බීජවලට ය. (2) ගල් අතර වැටුණු බීජවලට ය.
(3) කටු පඳුරු අතර වැටුණු බීජවලට ය. (4) සරු බිමේ වැටුණු බීජවලට ය.

36. ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ ලකුණු දක්වනු ලැබුවේ,
(1) ජනතාවට තම බලය ප්‍රසිද්ධියේ විදහා දැක්වීමට ය.
(2) උන් වහන්සේට ජනයාගේ ගෞරවය ලබා ගැනීමට ය.
(3) තමා වෙත පැමිණෙන සමාජයේ ප්‍රතික්ෂේප වූවන්ට දැක් වූ අසීමිත ප්‍රේමය නිසා ය.
(4) තමා දේව පුත්‍රයා බව අන් අයට ප්‍රදර්ශනය කිරීමට ය.

37. එම්මාවුස් කරා ගිය ගෝලයින්ගේ හදවත් දැවී ඇවිලී ගියේ, ජේසුස් වහන්සේ,
(1) කල්වාරි පුවත නොදන්නා බව පැවසූ විට ය.
(2) එම්මාවුස් පසුකර යාමට සැරසුණු විට ය.
(3) රොටී ගෙන ආශීර්වාද කළ විට ය.
(4) ශුද්ධ ලියවිලි පහදා දුන් විට ය.

38. ''සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දෙන්න.'' ජේසුස් වහන්සේ මෙලෙස ප්‍රකාශ කළේ,
(1) සද්දුසිවරුන් ට ය. (2) පරිසිවරුන්ට ය.
(3) අයකැමියන්ට ය. (4) විනයධරයන්ට ය.

39. ''ජෙරුසලමේ දූවරුනි මා නිසා නොහඬන්න. **ඔබ සහ ඔබේ දරුවන් නිසා ම හඬන්න.**'' ඉහත ප්‍රකාශයෙ හි තද කළු අකුරින් මුද්‍රිත (ඉරි ඇඳි වාක්‍යය) ප්‍රකාශනයෙන් ලබා දෙන ඉඟිය වන්නේ,
(1) ජේසුස් වහන්සේගේ කුරුසිපත් වීම අම්ල වූ මෙහෙවරක් බව ය.
(2) පාපයේ ගැලී සිටීමට සූදානම් ව සිටිය යුතු බව ය.
(3) පාපයෙන් පිරි ලොන තුළ අත් විඳින්නට සිදුවන විපත් පිළිබඳවය.
(4) ජේසුස් වහන්සේගේ කුරුසිපත් වීම සාධාරණ බව ය.

40. තිබේරියස් විල හැඳින් වූ තවත් නමක් වන්නේ,
(1) ගලීල මුහුද ය. (2) ජෝර්දාන් ගඟ ය.
(3) බෙත්සයිදා පොකුණ ය. (4) රතු මුහුද ය.

(ලකුණු 1 x 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

10 ශ්‍රේණිය

ක්‍රිස්තියානි ධර්මය - II

කාලය පැය 02 යි
අමතර කාලය මිනිත්තු 10 යි

නම/ විභාග අංකය:

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

---

01. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
    (i) දිවැසිවර යෙසායා පැවසූ පරිදි පැමිණෙන්නට සිටින තැනැත්තාගේ රාජ්‍යය තුළ දැකිය හැකි ලක්ෂණ දෙක ලියා දක්වන්න.
    (ii) ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ මෙහෙය ආරම්භ කළ ප්‍රදේශය හා ස්ථානය ලියා දක්වන්න.
    (iii) ප්‍රේරිතයන්ගේ ධර්ම දූත චාරිකාවලින් ලද ප්‍රතිඵල දෙකක් ලියා දක්වන්න.
    (iv) ජේසුස් වහන්සේ යුදා කාන්තාවන්ට සහනය සැලසූ අවස්ථා දෙකක් ලියා දක්වන්න.
    (v) ජේසු බිළිඳාව කැපකරන අවස්ථාවේ දී දේව මාළිගාව තුළ සිටි විශේෂ පුද්ගලයින් දෙදෙනා නම් කරන්න.
    (vi) රෝම රාජ්‍යයට බදු ගෙවීමට හා දේව මාළිගාවේ බද්ද ගෙවීම සඳහා භාවිත කළ කාසි වර්ග දෙක වෙන වෙන ම ලියන්න.
    (vii) ''පරීක්ෂාවට නොවැටෙන පිණිස නැගිට යාච්ඥා කරන්න.'' මෙලෙස ප්‍රකාශ කළේ කවු ද? කා හට ද?
    (viii) දේව රාජ්‍යයේ තීරණාත්මක මොහොත වනුයේ කුමක් ද?
    (ix) දේව රාජ්‍යයේ පුරවැසියන් තම අවශ්‍යතා ගැන කරදරවීම අනවශ්‍ය බව දැක්වීමට ජේසු තුමා ස්වභාව ධර්මය ඇසුරෙන් ගෙනහැර දැක් වූ උදාහරණ දෙක නම් කරන්න.
    (x) රූප විපර්යාසයේ දී ජේසුස් වහන්සේ දෙපස දර්ශනය වූ පුද්ගලයින් දෙදෙනා නම් කරන්න.

(ලකුණු 2 × 10 = 20)

02. (i) දිවැසිවරයා යන්න කෙටියෙන් හඳුන්වන්න.
    (ii) ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ දී යුදා සමාජය තුළ පවිකරුවන් ලෙස සැලකූ පුද්ගල කණ්ඩායම් තුනක් ලියා දක්වන්න.
    (iii) කිතුනු දරුවෙකු ලෙස බව දිවැසි කාර්යයෙහි යෙදෙන ආකාර පහක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03. (i) කිතු උපත හා සම්බන්ධ දේව සැලැස්මට අවනත වූ පුද්ගල චරිත දෙකක් ලියා දක්වන්න.
    (ii) මරියතුමිය එළිසබෙත් තුමියව බැහැ දැකීමට ගිය අවස්ථාවේ එළිසබෙත් තුමිය විසින් සිදුකළ ප්‍රකාශය ලියා දක්වන්න.
    (iii) ජේසුස් වහන්සේ තම මෙහෙවරේ දී අන් අයගේ ජීවිතවලට ආලෝකයක් වූ අවස්ථා පහක් ලියා කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

04. (i) ස්නාවක ජොහාන්තුමාගේ සේවයේ මූලික පරමාර්ථය වූයේ කුමක් ද?
    (ii) ස්නාවක ජොහාන්තුමාගේ අනුශාසනා ලැබූ ජන කණ්ඩායම් තුනක් ලියා දක්වන්න.
    (iii) ස්නාවක ජොහාන්තුමාගේ අවවාද හා අනුශාසනා ඇසුරෙන් කිතුනු දරුවක ලෙස ඔබ ක්‍රියාකරන ආකාර පහක් කෙටියෙන් ලියා විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05. (i) ජේසුස් වහන්සේ කුරුසිපත් වූ අවස්ථාවේ සොබාදහමේ හි සිදු වූ වෙනස්කම් දෙකක් ලියන්න.

(ii) ජේසුස් වහන්සේට එරෙහිව පිලාත් ආණ්ඩුකාරවරයා ඉදිරියේ නගන ලද චෝදනා තුන නම් කරන්න.

(iii) ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ වූවන් පස් දෙනෙකු නම්කර ඔවුන් දැක් වූ ප්‍රතිචාර කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06. (i) ජේසුස් වහන්සේ දේව රාජ්‍ය හඳුන්වා දීම සඳහා යොදාගත් ඉගෙනුම් ක්‍රමවේදය හා එය පිළිගැන් වූ භාෂාව ලියා දක්වන්න.

(ii) දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳව පැවසීමට ජේසුස් වහන්සේ ඉගැන් වූ උපමා කතා තුන නම් කරන්න.

(iii) දේව රාජ්‍යයේ වර්ධනයට දායක වීමට කිතුනු දරුවකු ලෙස ඔබට ක්‍රියාකළ හැකි ආකාර පහක් කෙටියෙන් ලියා විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) මුල් ශ්‍රාවකයින් කැඳවීම.
- කැඳවනු ලැබූ ස්ථානය.
- කැඳවනු ලැබූ ශ්‍රාවකයන් (කැඳවා ගත් ආකාරය)
- පේදුරුගේ ප්‍රතිචාරය
- පේසු තුමාගේ පිළිතුර
- ඔබේ ජීවිතයට ලැබෙන ආදර්ශ

(ii) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා.
- පැමිණි පරීක්ෂා ගණන හා ස්ථානය
- පැමිණි පරීක්ෂා
- ලබා දුන් පිළිතුරු
- පාසල් දරුවෙකු ලෙස ඔබට පැමිණෙන පරීක්ෂා
- එම පරීක්ෂා ජයගන්නා ආකාරය

(iii) රූප විපර්යාසය
- රූප විපර්යාසය සිදු වූ ස්ථානය හා එහි යාමේ අරමුණ
- සහභාගී වූවන්
- සිදු වූ විශේෂ සිදුවීම.
- අහසින් නැගුණු හඬ ශබ්දය
- පේදුරුගේ ප්‍රකාශය

(iv) නාසරෙත්හි ප්‍රථම දේශනය.
- ප්‍රථම දේශනය සිදුකළ ස්ථානය හා කියවනු ලැබූ ග්‍රන්ථය
- උන්වහන්සේගේ සේවයේ අරමුණු.
- ප්‍රථම දේශනයෙන් පසු ලැබුණු ප්‍රතිචාර
- අන්‍ය ජාතීන් අගය කිරීම සඳහා පැරණි ගිවිසුමෙන් ගත් උදාහරණ දෙක.
- තමා ප්‍රතික්ෂේප වූ දිවැසිවරයා බව පෙන්වීමට යොදාගත් ජුදා ප්‍රස්තාව පිරුළු දෙක

(ලකුණු 5 + 5 = 10)

Past Papers Wiki

පිළිතුරු පත්‍රය - I පත්‍රය

01. (2)	02. (3)	03. (4)	04. (2)	05. (1)	06. (4)	07. (1)	08. (2)	09. (3)	10. (2)
11. (3)	12. (4)	13. (1)	14. (3)	15. (1)	16. (3)	17. (1)	18. (4)	19. (2)	20. (4)
21. (4)	22. (2)	23. (1)	24. (4)	25. (3)	26. (1)	27. (3)	28. (4)	29. (2)	30. (1)
31. (4)	32. (3)	33. (2)	34. (3)	35. (4)	36. (3)	37. (4)	38. (1)	39. (3)	40. (1)

(ලකුණු 40)

II පත්‍රය

01. (i) යුක්තිය හා ධර්මිෂ්ඨකම

(ii) ★ ගලීලයේ නාසරෙත් ★ සිනගෝගය (ධර්මශාලාව)

(iii) ★ රටපුරා සුබ අස්න ප්‍රකාශ වීම.
★ දේව නාමයෙන් රෝගීන් සුව කිරීම.
★ දුෂ්ඨ ආත්ම යටපත් වීම.

(iv) ★ මාර්තා හා මරියාගේ නිවසට යාම.
★ සමාරිය ස්ත්‍රියට ශුභාරංචිය පැවසීම.
★ පව්කාර ස්ත්‍රියට සමාව දීම ආදී කාන්තාවන්ට සහනය සැලසූ අවස්ථා 02 ලියා තිබීම.

(v) ★ සිමියොන් හා අන්නා

(vi) ★ රෝම රාජ්‍යයට - දිනාර් කාසි
★ දේව මාළිගාවට - තඹ කාසි

(vii) ජේසුස් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට

(viii) ★ ජේසුස් වහන්සේගේ නැවත පැමිණීම.

(ix) ★ කපුටන් ★ මානෙල් මල්

(x) මෝසෙස් හා එළියා

(ල. 2 × 10 = 20)

02. (i) දෙවියන් වහන්සේගේ කැඳවීම තුළ දේවාත්මානුභාවයෙන් එළිදරව් කරන ලද දේව පණිවුඩය ජනතාවට පිළිගැන්වූ තැනැත්තාය.

(ii) ★ කාන්තාවන් ★ දරුවන් ★ රෝගීන් ★ වහලුන් ★ අන්‍යජාතීන්

(iii) දරුවා ලියා ඇති සුදුසු පිළිතුරු 05 ක් කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ල. 2 + 3 + 5 = 10)

03. (i) සෙකෙරියස් පූජක තුමා, ජෝසෙප්, මරිවතුමී, එළිසබෙත්

(ii) ''ඔබ වනිතාවන් අතර ආශිර්වාද ලද්දීය.''
''මාගේ ස්වාමීන් වහන්සේගේ මෑණියන්''

(iii) පවින් මුදවා ගැනීමක්, සුව කිරීමක්, මුළවුන්ගෙන් නැගිටුවීමක් ආදී අවස්ථා වලින් 05 ක් කෙටියෙන් විස්තර කර තිබීම.

(ල. 2 + 3 + 5 = 10)

04. (i) ජේසුස් වහන්සේ මෙසියස් වහන්සේ ලෙසට පිළිගැනීමට අවශ්‍ය කරන පසුබිම සකස් කිරීම ය.

(ii) ★ පොදු ජනතාව
★ රාජ්‍ය සේවයේ යෙදී සිටි අය (අයකැමියන්)
★ ආරක්ෂක අංශය (භේටායෝ)
★ ජුදා ආගමික ජනතාව

(iii) සිසුවා ලියා ඇති සුදුසු පිළිතුරු 05 ක් කෙටියෙන් විස්තර කර තිබීම.

(ල. 2 + 3 + 5 = 10)

05. (i) ★ හිරු අඳුරුවීම (අන්ධකාරයක් ඇති වීම.)
★ පොළෝ කම්පාවක් ඇති වීම.

(ii) ★ ජාතිය කැරලිගැසීමට පෙළඹවීම.
★ අධිරාජ්‍යාට බදු ගෙවීම තහනම්කිරීම
★ තමා ක්‍රිස්තුන් නම් රජෙකු බව ප්‍රකාශ කිරීම.

(iii) ★ කිරේනියේ සීමොන් - කුරුසිය රැගෙන යාමට උදව් වීම.
★ අරිමාතියේ ජෝසෙප් - සොහොන් ගෙය ලබාදීම.
★ කාන්තාවන් (ස්ත්‍රීන්) - හඬමින් පසුපස යෑම.
★ මුර සෙබළුන් - ''ඔබ ජුදෙව්වරුන්ගේ රජු නම් ඔබම ගළවා ගන්න.
★ එක් සොරෙක් - ''ඔබ රාජශ්‍රීයෙන් වඩනා කළ මා සිහිකළ මැනව'' ආදිය කෙටියෙන් විස්තර කිරීම.

(ල. 2 + 3 + 5 = 10)

පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

06. (i) ★ උපමා මගින්
★ ඇරමයික් භාෂාව

(ii) ★ අබ ඇටයේ උපමාව
★ මුහුන් පිළිබඳ උපමාව
★ වපුරන්නාගේ උපමාව

(iii) සිසුවා සමාජයේ ආදර්ශමත් ලෙස ක්‍රියාකරන ආකාර 05 ක් ලියා තිබීම. හා එය විස්තරකර තිබීම.

(ල. 2 + 3 + 5 = 10)

07. (I) (i) ගලීල මුහුදු වෙරළ

(ii) පේදුරු ඇන්ඩෘ, ජාකොබ්, ජොහාන් (කැඳවාගත් අයුරු)

(iii) ''මා පච්කාරයෙක්, මා වෙතින් ඉවත්වුව මැනව'' කියා වැඳ වැටී කළ ඉල්ලීම.

(iv) ''බිය නොවන්න'' මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇත.''

(v) ★ තරාතිරම් නොබලා කැඳවීම ලැබෙන බව
★ අනපේක්ෂිත ලෙස දේව කැඳවීම ලැබෙන බව.
★ දේව හඬට කීකරු විය යුතු බව.
★ ජේසුතුමා සැබෑ ලෙස හඳුනා ගැනීමෙන් අපේ පව් අවබෝධ වන බව.
★ දේව බලය තුළ හාස්කම් සිදුවන බව.

(II) (i) පරීක්ෂා 03 කි. පාඨකරයේ

(ii) ★ ගල් පාන් බවට පත් කිරීමට පැවසීම.
★ ජේසුස් වහන්සේට නමස්කාර කිරීමට පැවසීම.
★ දේව මාළිගාවේ කොත මුදුණින් පැණීමට අණ කිරීම.

(iii) ★ ''මිනාසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේය.''
★ නුඹේ දෙවි ස්වාමීන් වහන්සේට පමණක් නමස්කාර කරන්න.''
★ නුඹේ දෙවි වන ස්වාමීන් වහන්සේ පරීක්ෂා නොකරන්න.

(iv) දරුවා ලියා ඇති පරීක්ෂණ

(v) දේව වචනය, යාච්ඤාව, යහපත් මිතුරන් ඇසුරු ආදී දේ ලියා තිබීම.

(III) (i) කඳු මුදුනක, යාච්ඤා කිරීමට යාම.

(ii) ජේසුස් වහන්සේ හා පේදුරු ජාකොබ්, ජොහාන්

(iii) ★ ජේසුතමාගේ මුහුණු, වස්ත්‍ර ධවල කාන්තියෙන් බැබලීම.
★ දෙපස එළිය, මෝසෙස් දර්ශනය වීම.

(iv) ''මේ මාගේ පුත්‍රයාණෙනි, මේ මා තෝරාගත් තැනැත්තානෝය.'' මොහුට සවන් දෙන්න.''

(v) මාණ්ඩප තුනක් සාදා කඳු මුදුනේ රැඳී සිටීමට කළ යෝජනාව

(IV) (i) ★ නාසරෙත්හි ධර්මශාලාව, යෙසායාගේ ග්‍රන්ථය

(ii) ★ දිළිඳුන්ට ශුභාරංචිය දේශනා කිරීම.
★ වහලුන්ට මිදීම.
★ අන්ධයන්ට පෙනීම ලැබෙන බව.
★ පීඩිතයන් මුදවාලීම.

(iii) ★ උන්වහන්සේව පිළිනොගැනම, ප්‍රතික්ෂේප කිරීම.

(iv) ★ ශාරපෙත් හි වැන්දඹුව මඟින් එළිෂා පෝෂණය කිරීම.
★ එළිෂා මඟින් සුවය ලැබීමට නාමන් තෝරා ගැනීම.

(v) ''වෙද තුමාණෙනි ඔබම සුව කරගන්න.''
''ගමේ දිවැසිවරයා ගමට අගේ නැත.''

(ල. 5 + 5 = 10)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank